# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2322/72 - 2023 මාර්තු මස 11 වැනි සෙනසුරාදා - 2023.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) හා 154 (ඊ) ව්‍යවස්ථා මගින් ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක 04 දරන ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 5 (1) හා 7(1) වගන්ති ප්‍රකාරව, මා විසින් පහත සඳහන් පත්කිරීම් සිදු කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | නම | තනතුර | පත්කළ දිනය |
|---|---|---|---|
| 01. | නීතිඥ සුජීව ජයසිංහ මහතා,<br>5ඒ, බණ්ඩාරනායක මාවත,<br>බදුල්ල | ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති | 2023.02.13 වන දින සිට |
| 02. | චොඩ්සන් අලවත්ත මහතා,<br>කැන්බෝ හෝටලය, බිබිල | ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජික | 2023.02.13 වන දින සිට |
| 03. | ආර්. එම්. සී. රත්නායක මහතා,<br>අංක 237, ස්ප්‍රිංවැලි පාර,<br>බදුල්ල | ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජික | 2023.02.13 වන දින සිට |
| 04. | ආර්. එම්. ඩග්ලස් කුමාරතුංග මහතා,<br>අංක 277, මොණරාගල පාර,<br>බඩල්කුඹුර | ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජික | 2023.02.13 වන දින සිට |

| | | |
|---|---|---|
| 05. කේ. ජී. එන්. නානායක්කාර මහතා, නො. 27, බෝගහඅරාව පාර, මොණරාගල | ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජික | 2023.02.13 වන දින සිට |

ඒ. ජේ. එම්. මුසම්මිල්,
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2023 මාර්තු මස 08 වැනි දින,
බදුල්ල, ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 03 - 0143

---

## ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ගාමිණී මහින්දපාල ජෝපියස් මහතා, 2023.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්,

02. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරි එච්. එම්. ජේ. හේරත් මහතා, 2023.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තනතුරේ පූර්ණකාලීනව වැඩ බැලීමට,

03. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරි එන්. එම්. එස්. පී. කේ. නිශ්ශංක මහතා, 2023.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් කර්මාන්ත අධ්‍යක්ෂ තනතුරේ පූර්ණකාලීනව වැඩ බැලීමට,

04. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරිණී ජී. ඩබ්. එන්. චතුරංගී මහත්මිය, 2023.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් වශයෙන්,

05. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරි ඩබ්. එම්. පී. කුමාර මහතා, 2023.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, මොණරාගල සහකාර පළාත් පාලන කොමසාරිස් වශයෙන්,

06. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරි ඉංජි. ඒ. එම්. ජේ. ටී. ගංගානන්ද මහතා, 2023.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ වශයෙන්,

07. ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ආර්. ටී. එල්. එස්. ජයසිංහ මහතා, 2023.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ වශයෙන්,

08. ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරි සමන්ත කිත්සිරි මහතා, 2023.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් අධ්‍යක්ෂ (අයවැය) වශයෙන්,

09. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II ශ්‍රේණියේ නිලධාරි ආර්. එම්. දයාරත්න මහතා, 2023.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු හා සමාජ සුභසාධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) තනතුරේ පූර්ණකාලීනව වැඩ බැලීමට,

10. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II ශ්‍රේණියේ නිලධාරි එච්. එම්. එස්. ටී. සම්පත් මහතා, 2023.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) තනතුරේ පූර්ණකාලීනව වැඩ බැලීමට,

11. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරි එච්. එම්. එම්. ඩී. හේරත් මහතා, 2023.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට,

12. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ඩබ්. එම්. ආර්. රංජිත් මහතා, 2023.01.02 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) වශයෙන්,

13. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරි ඒ. එච්. ආර්. අමරදාස මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි, තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව (2023.01.16 වන දින සිට) ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට,

14. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරි එච්. එම්. එම්. ඩී. හේරත් මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි, (2023.01.09 වන දින සිට) බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්,

15. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරිණි එස්. එන්. හෙට්ටිආරච්චි මහත්මිය, වහාම ක්‍රියාත්මක වන පරිදි, (2023.01.09 වන දින සිට) වියළුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්,

16. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරිණි පී. ජී. කේ. කේ. එස්. විමලවීර මහත්මිය, වහාම ක්‍රියාත්මක වන පරිදි, (2023.01.09 වන දින සිට) වැලිමඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්,

17. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරිණි එම්. ඒ. සරීනා බේගම් මහත්මිය, වහාම ක්‍රියාත්මක වන පරිදි, (2023.01.09 වන දින සිට) පස්සර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්,

18. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරි ඒ. එච්. ආර්. අමරදාස මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි, (2023.01.09 වන දින සිට) අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්,

19. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරි ජේ. එම්. සේනාධීර මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි, (2023.01.09 වන දින සිට) අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන) වශයෙන්,

20. දේශීය ආදායම් සේවයේ I ශ්‍රේණියේ නිලධාරි පී. ජී. ජයරත්න ගමගේ මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි, (2022.12.14 වන දින සිට) ඌව පළාත් ආදායම් කොමසාරිස් වශයෙන්,

21. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියේ නිලධාරි එච්. කේ. පී. ජයලත් මහතා, 2023.01.28 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව, ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට,

22. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරි ඉංජි. පී. එම්. අමරසේකර මහතා, 2023.02.07 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් මාර්ග අධ්‍යක්ෂ වශයෙන්,

23. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරි ඩී. එම්. ප්‍රේමරත්න මහතා, තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව 2022.12.01 වන දින සිට 2023.05.31 දක්වා ක්‍රියාත්මක වන පරිදි මහියංගන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

**ඒ. ජේ. එම්. මුසම්මිල්,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2023 මාර්තු මස 08 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 03 - 0143/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.